DOI : 10.31357/fhssmst.1997.00673

# රොඩී ජනතාව සහ සමාජ වෙනස්වීම
## (ලාව ප්‍රදේශයේ රොඩී ජනතාව පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක විශ්ලේෂණයක්)

ටී. එම්. ධම්මිකා සුභාෂිණි

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ ශාස්ත්‍රපති උපාධි
(සමාජ විද්‍යා)
පරීක්ෂණය සඳහා

ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ගංගොඩවිල
නුගේගොඩ

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
28.11.97
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

1997

# The Rodiyas and Social Change

(A Socio Anthropological Analysis on Rodiya People of the UVA Province)

T . M . Dhammika Subashini

A Thesis Submitted for the Fulfilment of the Requirement

for the Degree of

Master of Arts ( Sociology ) in the

Department of Sociology and Anthropology

in the University of Sri Jayawardanapura

Department of Sociology and Anthropology

University of Sri Jayawardanapura

Gangodawila

Nugegoda

Sri Lanka

1997

## කර්තෘගේ ප්‍රකාශය

"මෙම පර්යේෂන නිබන්ධය මවිසින් ස්වාධීනව නිම කරන ලද්දක් බවත් , මාගේ අදහස්වලට පරිබාහිර සියලු තොරතුරු දැක්වීමේදී ඒ පිළිබඳ මූලාශ්‍ර සඳහන් කර ඇති බවත් , මෙම නිබන්ධනය හෝ එහි කොටසක් වෙනත් විශ්ව විද්‍යාලයක හෝ ආයතනයක පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කර නොමැති බවත් සහතික කරමි. එසේම මෙම පර්යේෂණ නිබන්ධය මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා සහ ආචාර්ය එච්.ඩබ්ලිව්.කරුණාරත්න මහතා යන අයගේ උපදේශකත්වයෙනුත් , පූර්ණ අධීක්ෂණය යටතේත් සම්පාදනය කරන ලද්දක් බව සඳහන් කරමි".

ටී.එම්.ධම්මිකා සුභාෂිණී
සමාජ විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්ව විද්‍යාලය
කැලණිය

මාගේ ආදරණීය දෙමව්පියන්ට හඳපිරි බැතින් පුද කරමි

# උපකාරානුස්මෘතිය

රොඩී ජනතාව සහ සමාජ වෙනස්වීම පිළිබඳ මෙම සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනය , සමාජ විද්‍යාත්මක සහ සමාජ මානව විද්‍යාත්මක විෂය ක්ෂේත්‍රයන් තුළ පර්යේෂණාත්මකව සම්පාදනය කරන ලද්දකි. ශ්‍රී ලංකාවේ වෙසෙන මානව වංශික කොටස් අතුරින් සමාජයෙන් අතුරුදහන් වී යන රොඩී නැතහොත් ගාඩි නමැති ජන කොටස පිළිබඳව සමාජ මානව විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් අධ්‍යයනය කිරීම වැදගත් බැව් හැඟුණි. මෙවන් උත්සාහයක් සිදු නොවුන හොත් තව කෙටි කාලයකින් ඔවුන් පිළිබඳව තොරතුරක් පවා දැනගත නොහැකි වනු ඇත. ඒ අඩුව පිරිමසාළමින් මෙම උත්සාහය සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය දුන් සියලුම දෙනා මෙහිදී ඉතා ගෞරවයෙන් යුක්තව සිහිපත් කරමි.

පර්යේෂණයේ ආරම්භයේ සිට එහි අවසානය දක්වා සියලු උපදෙස් සහ මහ පෙන්වමින් මා දිරිමත් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා සහ මානව විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය නන්දසේන රත්නපාල මහතාට මාගේ කෘතඥ පූර්වක ස්තුතිය මෙයින් පුද කරමි. එසේම මෙම පර්යේෂණය සාර්ථක අයුරින් නිම කර ගැනීම සඳහා පතපොත ලබා දෙමින්ද නිසි උපදෙස් දෙමින් ද කටයුතු කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බී . ඒ . ටෙනිසන් පෙරේරා මහතාට මාගේ භක්ති ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමි.

තවද ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන එඩ්වින් කේ . ගණිහිගම මහතාද සෑම අවස්ථාවකදීම මාගේ නිබන්ධය සාර්ථක කර ගැනීමට කළ උපකාරයන්ද සිහිපත් කළ යුතු අතර එයට ද මාගේ ගුරුබැති පුදමි.

නිබඳව මා දිරිගන්වමින් මාගේ අධ්‍යයන කටයුතු සඳහා උපදෙස් ලබා දෙමින් නිරතුරුවම සහයෝගය ලබාදෙන කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන ආචාර්ය එච් . ඩබ්ලිව් . කරුණාරත්න මහතාටද මාගේ ස්තුතිය පුද කරමි.

එමෙන්ම මෙම නිබන්ධය සාර්ථක අයුරින් නිමකර ගැනිමට සහය දුන් කැලණිය විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හර්සන් ඩයස් මහතාටද කැළණිය , ශ්‍රී ජයවර්ධනපුර , පේරාදෙණිය සහ කොළඹ යන විශ්ව විද්‍යාලයන්හි මාගේ හිතවත් මිතුරු මිතුරියන් ද පොත්පත් සොයා ගැනීමේදී කළ උපකාරයන් මෙම අවස්ථාවේදී අමතක නොකරමි. ඒ සියලු දෙනාටම ද මාගේ අවංක ස්තුතිය පිරි නමමි.

මාගේ ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා තෝරාගත් ගම්මානවන නිල්මල්පොත සහ කළමඩුගස්තැන්න (පාරම්ගම) ගම්වාසීන් ගේ සහයෝගයද අගය කොට සැලකිය යුතුය. අවශ්‍ය අවස්ථාවන්හිදී තොරතුරු ලබා දෙමින් පර්යේෂණයේ ආරම්භයේ සිට අවසානය දක්වා මා හා ඉතා කුළුපගව කටයුතු කළ කන්දේගෙදර මධ්‍ය මහා විද්‍යාලයේ උප විදුහල්පති ජයතිලක මහතාත් , නිල්මල්පොත සහ කළමඩුගස්තැන්න යන ගම්වල ග්‍රාම නිලධාරි මහතුන් හෘදයඞ්ගම ව සිහිපත් කරමි.

මා හදා වඩා නිසිමග යොමුකළ මාගේ ආදරණිය මෑණියන් පියාණන්, සහෝදර සහෝදරියන් මෙම කටයුත්තේ දී ද මට ලබාදුන් සහයෝගය සිහිකරන අතර නිබඳව මා දිරිමත් කළ නවාද බැතියෙන් සිහිපත් කරමි.

ටි . එම් . ධම්මිකා සුභාෂිණී
සමාජ විද්‍යා අධ්‍යයන අංශය
කැළණිය විශ්ව විද්‍යාලය
දළුගම , කැළණිය
1997 නොවැම්බර්

# සංක්ෂේපය

ඈත අතීතයේ පටන්ම ලෝකයේ විසූ ජන කොටස් පිළිබඳව පෘථුල දැනුම් සම්භාරයක් අපට ලබා ගත හැකි වන්නේ ඒ සම්බන්ධව ලියැවී ඇති කෘති පරිශීලනය කිරීමෙනි. සමාජ මානව විද්‍යා විෂය ක්ෂේත්‍රය ආලෝකමත් කරමින් එහි අභිවෘද්ධිය සඳහා කටයුතු කළ සමාජ විද්‍යාඥයින් සම මානව විද්‍යාඥයින්ගෙන් සිදු වූ සේවාව කෙතරම් දැයි අපට නිශ්වය කළ නොහැක. ඔවුහු ලෝකය පුරාම ව්‍යාප්තව සිටින විවිධ මානව කොටස් පිළිබඳව අධ්‍යයනයන් රැසක් කර ඇත. ඒ ඒ ජන කොටස්වල ඥාතීත්වය , පවුල්ක්‍රම , විවාහය , ආගම , නීති සහ දේශපාලන සංවිධාන කෙරෙහි අවධාරණය කරමින් සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය උපයෝගි කර ගෙන අධ්‍යයනයන් සිදු කොට ඒ පිළිබඳ කෘතීන් රැසක් ද එළි දක්වා ඇත.

ශ්‍රී ලාංකික සමාජයේ ද විවිධ ජන කොටස් වෙසෙන බව පෙනේ. එනම් අහිකුණ්ඨික , වැද්දන් , රොඩීන් සහ කින්නරයන් ආදි ජන කොටස් තවමත් අප සමාජයේ වෙසෙති. එසේ වුවද එවැනි ජන කොටස්වල සීඝ්‍රයෙන් සිදුවිගෙන යන වෙනසකම් හේතුවෙන් ඔවුන්ගේ සමාජයන්හි සම්ප්‍රදායිකව තිබූ සාරධර්ම , අගයයන්, විශ්වාස සහ සිරිත් විරිත් යනාදිය වෙනස්වෙමින් පවතින බව පෙනේ. මෙලෙස රොඩී ජනතාව ද සමාජ වෙනස්වීමට ලක් වූ ජන කොටසක් වූ බැවින් ඔවුන් පිළිබඳව සමාජ මානව විද්‍යාත්මක විග්‍රහයක් සිදු කිරීම කාලෝචිත යැයි මා හට හැඟී ගිය හෙයින් මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය කිරීමට පෙළඹුණෙමි. මෙවන් ජන කොටස් පිළිබඳව කරුණු එක්රැස් කොට තැබීම මගින් සමාජ මානව විද්‍යා විෂය ක්ෂේත්‍රය පෝෂණය වීමට ලැබෙන අනුබලය කිව නොහැකි තරම්ය. මෙලෙස කාලයේ වැලි තලාවෙන් වෙනස්වෙමින් , අතුරුදහන් වී යන ජන කොටසක් වූ රොඩී ජනතාව පිළිබඳව අධ්‍යයනය කිරීම මා ලද මෙම අවස්ථාව භාග්‍යයක් කොට සලකමි. ඒ අනුව පර්යේෂණය සඳහා රොඩී ජනතාව සහ සමාජ වෙස්වීම යන මාතෘකාව යටතේ සමාජ මානව විද්‍යාත්මක විශ්ලේෂණයක් කරන ලදි. මෙහිදී පර්යේෂණ ගැටළුව වශයෙන්

යොදා ගනු ලැබුවේ රොඩී ජනතාව සමාජ වෙනස්වීමට ලක් වී ඇති ද යන්නයි. මෙම ගැටළුව විසඳා ගැනීම සඳහා විද්‍යාත්මක ක්‍රම වේදයන් කිහිපයක්ම භාවිත කිරීමට සිදු වුණි. ඒ අනුව දත්ත එක්රැස් කිරීම සඳහා ලිඛිත සහ අලිඛිත මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කෙරුණි. පර්යේෂණ ක්ෂේත්‍රය තුළින් දත්ත ලබා ගැනීමේදී ප්‍රධාන ක්‍රම වේදයන් ලෙස යොදා ගනු ලැබුවේ නිරික්ෂණ ක්‍රමය , සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ සහභාගිත්ව නිරික්ෂණ ක්‍රමය යන ක්‍රම වේදයන් වේ. උගත්කමින් අඩු මිනිසුන් වෙසෙන සමාජයක් අධ්‍යයනය කිරීමේදී ප්‍රශ්නාවලි ක්‍රමය එතරම් සාර්ථක දත්ත රැස් කිරීමේ ක්‍රමයක් නොවෙයි.

මේ නිසා එම ක්‍රමය යොදා ගැනීම සඳහා උනන්දු නොවුණි. පර්යේෂණ ක්ෂේත්‍රයෙන් ලබාගත් දත්ත සහ ඔවුන් පිළිබඳව ඇති ලිඛිත මූලාශ්‍ර උපයෝගී කර ගනිමින් ඔවුන් සමාජ වෙනසකට භාජනය වී ඇද්ද සහ එසේ වෙනස්වීමට භාජනයවී ඇත්නම් ඒ සඳහා බලපෑ ප්‍රධාන සාධක කවරේද යන්න සොයා බැලීම්. ඒ අනුව සමාජ , ආර්ථික , අධ්‍යාපනික , දේශපාලන සහ සංස්කෘතික යන සාධක රොඩී සමාජයේ වෙනස්වීම කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳව කරුණු විග්‍රහ කර බැලුණි. තවද යටත් විජිත යුගයෙන් පසුව , නිදහස් අධ්‍යාපනය සහ 1977 න් පසු නිදහස් ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම ආදිය හේතුවෙන් රොඩී සමාජය වෙනසකට භාජනය වී ඇති බව පෙනී ගිය කරුණකි. රොඩී ජනතාව ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්තව ඇත.

එහෙත් ශ්‍රී ලංකාවේ සිටින සියලුම රොඩී ජනතාව උපයෝගී කරගෙන ඔවුන් සමාජ වෙනස්වීමට භාජනයවී ඇද්ද යන්න සොයා බැලිය නොහැක. මේ නිසා ක්ෂේත්‍ර අධ්‍යයනය වශයෙන් ඌව පළාතේ ,බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල පිහිටි කළමඩුගස්තැන්න ගම්මානය සහ හාලිඇළ කන්දේගෙදර පිහිටි නිල්මල්පොත ගම්මානය මේ සඳහා තෝරා ගන්නා ලදි. මෙම ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ලැබුණු දත්තවලට අනුව සමාජ වෙනස්වීමට අනුකූලව රොඩී ජනතාව ද වෙනසකට භාජනයවී ඇති බව නිගමනය කළ හැකිය.

## පටුන


| පිදුම | පිටුව |
|---|---|
| උපකාරානුස්මෘතිය | |
| සංක්ෂෙපය | |
| **පළමුවැනි පරිච්ඡේදය** | |
| **පර්යේෂණ ප්‍රවේශය** | |
| 1.1 හැඳින්වීම | 1 |
| 1.2 පර්යේෂණයේ පරමාර්ථ | 8 |
| 1.3 පර්යේෂණ නියැදිය සහ පර්යේෂණ ගැටළුව | 11 |
| 1.4 පර්යේෂණ ක්‍රමවේදය සහ මූලාශ්‍ර | 15 |
| 1.5 පර්යේෂණ ක්‍රියාවලියේදී මතුවූ ගැටළු | 23 |
| 1.6 සීමාවන් | 25 |
| **දෙවැනි පරිච්ඡේදය** | |
| **රොඩී ජනතාවගේ ඉතිහාසය** | |
| 2.1 ඓතිහාසික පසුබිම | 28 |
| 2.2 භූගෝලීය පසුබිම | 54 |
| 2.3 සමාජ විද්‍යාත්මක පසුබිම | 65 |
| **තුන්වැනි පරිච්ඡේදය** | |
| **සමාජ වෙනස්වීම** | |
| 3.1 සමාජ වෙනස්වීම පිළිබඳ නිර්වචන | 85 |
| 3.2 සමාජ වෙනස්වීම පිළිබඳ න්‍යායන් | 88 |
| 3.3 සමාජ වෙනස්වීම කෙරෙහි බලපාන සාධක | 98 |

| | |
|---|---|
| ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 225 |
| Bibliography | 230 |
| උප ග්‍රන්ථය 1 කවි සහ මන්ත්‍ර | |
| උප ග්‍රන්ථය 1.1 බඩරුජාවට මන්ත්‍රය | 249 |
| උප ග්‍රන්ථය 1.2 බඩරුජාවට බුද්ධ මන්ත්‍රය | 250 |
| උප ග්‍රන්ථය 1.3 දත් කැක්කුමට මන්ත්‍රය | 251 |
| උප ග්‍රන්ථය 1.4 රත්න වල්ලි කවි | 252 |

පලමුවැනි පරිච්ඡේදය

පර්යේෂණ ප්‍රවේශය

1.1 හැඳින්වීම

1.2 පර්යේෂණයේ පරමාර්ථ

1.3 පර්යේෂණ නියැදිය සහ පර්යේෂණ ගැටළුව

1.4 පර්යේෂණ ක්‍රමවේදය සහ මූලාශ්‍ර

1.5 පර්යේෂණ ක්‍රියාවලියේදී මතුවූ ගැටළු

1.6 සීමාවන්

හඳුනා ගැනීම ද අපහසු කරුණක් වී ඇත. සමහර පුද්ගලයින් ඉහළ සමාජ තත්ත්වයක් පෙරදැරි කරගෙන නාගරික ප්‍රදේශ කරා සංක්‍රමණය වී තිබේ. එලෙසම කුලීන ජනයා හා සමානව සමාජ තත්ත්වයන් හා කාර්ය කොටස් ද මෙහෙය වනු ලබයි. තව වසර ගණනාවක් යන විට දී රොඩී ජනයා අප සමාජයෙන් අතුරුදහන් වී යන ජන කොටසක් බවට පත්වීම නොවැළැක්විය හැකි කරුණකි. ඒ නිසා මෙවැනි පහත් කුල පිළිබඳව සමාජ මානව විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් කරුණු විග්‍රහ කර බැලීම අත්‍යවශ්‍යය.

මානව වංශික කොටස් පිළිබඳව අධ්‍යයනය කරන සමාජ මානව විද්‍යාඥයින්ට ,පුරාවිද්‍යාඥයින්ට , ඉතිහාසඥයින්ට රොඩී ජනයාගේ ප්‍රභවය, ගති සිරිත්, ජීවන ක්‍රමය, ආගම, යන්ත්‍ර මන්ත්‍ර සහ ශාරීරික ලක්ෂණ ආදිය ගැන දැන ගැනීම අතිශයින්ම වැදගත් වේ.

වර්තමානයේ දී ඔවුන් උපදිසාපති කාර්යාල සමඟ ද සමීප සම්බන්ධතා පවත්වා ගෙන යනු ලබයි. ඔවුන්ගේ සංවර්ධන කටයුතු සඳහා එම කාර්යාලවල සහයෝගය ලබා ගන්නා බව පෙනේ. එනම් ළිං කැපීම සහ මහාමාර්ග තැනවීම ආදි පොදු කටයුතු සඳහා අවශ්‍ය කරනු ලබන රැස්වීම් උදෙසා සහභාගිවීමත් දක්නට ලැබේ. අතීතයේදී ඔවුන් සමාජයෙන් නෙරපා හරින ලද ජන කොටසක් ලෙස ජීවිකාව ගෙන ගිය ද වර්තමානයේදී සමාජ වරප්‍රසාද ආදිය ලබමින් ඉදිරියට යන ජනතාවක් ලෙස හැඳින්වීම නිවැරදි වේ. අතීත ජන ජීවිතයට වඩා හාත්පසින්ම වෙනස් ජීවිත ගත කරනු ලබන ඔවුන් ක්‍රිස්තියානි ආගම ද වැළඳ ගෙන සිටී. පල්ලි කරා පිය නැගීම , ගීතිකා කීම සහ යාඥා කිරීම වැනි ආගමික කටයුතු ඔවුන් විසින් සිදු කරනු ලබයි. මේ අනුව පෙනී යන්නේ ඔවුන්ගේ ආගමික විශ්වාසයන් ද වෙනස්වෙමින් පවතින බවයි.

අතීතයේදී රොඩී ජනයාගේ සම්ප්‍රදායික රැකියාව වූයේ සිඟා කෑමයි. එහෙත් අධ්‍යයනයට භාජනය කළ බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල පිහිටි කළමඩුගස්තැන්න ගම්මානයේත් එම දිස්ත්‍රික්කයේ

හාලිඇල පහට් නිල්මල්පොත ගම්මානයේත් කිහිප දෙනෙකු පමණක් සිහා කෑම තවදුරටත් කරගෙන යනු ලබයි. එහෙත් වැඩි සංඛ්‍යාවක් සිහා කෑමෙන් වැලකී සිටින අතර, වෙනත් ආර්ථික කටයුතුවල ද නිරතවන බව පෙනේ. මේ අතර කුකුළන් ඇති කිරීම, ගවයන් ඇති කිරීම සහ එළුවන් ඇති කිරීම ආදි සත්වපාලන කටයුතුවල නිරත වී සිටින කොටසක් ලෙස ද මේ අය හැඳින්විය හැකිය. අධ්‍යාපනික වශයෙන් ද සලකා බලන විට පෙනී යන්නේ වැඩි පිරිසක් වර්තමානයේ දී අධ්‍යාපනික කටයුතුවල නිරත වන බවයි. ඒ අතර විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබාගත් පිරිස් ද ඇත. ඔවුන් ගුරු වෘත්තිය වැනි රැකියාවල නිරත වී සිටී. 1950 ට පෙර දී පමණ ඔවුනට පාසැල් යාම තහනම් විය. එලෙසම සමාජයීය වශයෙන් සලකා බලන විට ඇඳුම් පැළඳුම් ඇඳීමට පවා නිදහසක් ඔවුනට නොවිනි.

පුරුෂයින් උඩුකය වැසුවේ නැත. ස්ත්‍රීන් පපු පෙදෙස රෙදිකඩකින් ආවරණය කරගත් අතර ඉහෙන් පහළට රෙද්දක් අඳින ලදි. එහෙත් වර්තමානයේ දී එවැනි තත්ත්වයක් දක්නට නොලැබේ. ඔවුනට රිසියේ විවිධ විලාසිතාවන්ගෙන් යුක්තව ඇඳ පැළඳීමට නිදහස ලැබී ඇත. අතීතයේ දී කුඩ ගෙනයාම ද තහනම් වූ නමුත් වර්තමානයේ එවැනි තහංචි කිසිවක් දක්නට නොලැබේ. දේශපාලන වශයෙන් ද ඔවුන් ඉදිරියෙන් සිටිනු පෙනේ. විවිධ පක්ෂවල සමාජිකයන් රැසක්ම මෙම ගම්මාන තුළින් දැකිය හැකිවේ. වර්තමානයේ දී ඔවුනට කැමති දේශපාලන පක්ෂයක් තෝරා ගැනීමට නිදහස ලැබී ඇත.

මීට වසර ගණනාවකට පෙර දී මොවුනට පන්සල් භූමිවලට පවා ඇතුළුවීමට අවසර නොලැබුණු බව කියැවේ. වර්තමානයේ දී වැඩි පිරිසක් පන්සල්වලට යන බව පෙනේ. දැන් ඔවුනට කැමති ආගමක් ඇදහීමට නිදහස ලැබී ඇත. ඔවුන්ගේ නිවාස එක පියස්සකින් යුක්තව තැනීමට අවසර දී තිබුණි. එනම් මෙවැනි නීති ක්‍රියාත්මක වූයේ මහනුවර යුගයේදී ය. එසේ වුව ද වර්තමානයේ ඔවුනට සිතැගි පරිදි නිවාස තනා ගැනීමට අවකාශ ලැබී තිබේ. ඒ අතරම රොඩීන්ට ළිං වලින් ජලය ලබා ගැනීම තහනම් වුණි. ජල

වලකින් හෝ දිය අගලකින් ජලය ලබා ගැනීමට ඔවුනට සිදුවිය. එමෙන්ම ඔවුන් දිය ගන්නා ස්ථානවල ගව සම් කැබැල්ලක් එල්ලීම සිරිතක් විය. රොඩී ජනයාගේ බල්ලන්ගේ කරෙහි ගව සම් කැබැල්ලක් එල්ලිය යුතු වන අතර ගවයින්ගේ කරෙහි පොල්කටු මාල එල්ලිය යුතු වේ. එසේම ඔවුන් ඇති කරනු ලබන ඌරන්ගේ එක කණක් කැපිය යුතුය. මෙලෙස රොඩී මිනිසුන්ගේ අතීතය හාරා අවුස්සා බලන විට පසක් වන්නේ මොවුන්ට අතීතයේදී තහංචි රැසකට මුහුණ දීමට සිදු වී තිබුණු බවයි. එහෙත් වර්තමානයේදී එවැනි තහංචි කිසිවක් දක්නට නොලැබේ. ඒ හේතුවෙන් ඔවුන් ගුණාත්මක වශයෙන් ඉහළට සංචලනයක් වීමක් දක්නට ලැබේ.

රොඩී ජනතාව සම්බන්ධව තොරතුරු කෘතීන් ගණනාවකම තිබෙන බව පෙනේ. එනම් ජේ. ඇම්. පර්ගියුසන් විසින් *The Monthly Literary Register and Notes and Queries of Ceylon* සඟරාවට *The Rodiyas of Ceylon* නමැති ලිපිය ලියා ඇත. එහි රොඩී ජනතාව සම්බන්ධ කරුණු දක්නට ඇත. ඇම්. ඩී. රාඝවාන් රොඩී ජනතාව පිළිබඳව *Handsome Beggars* නමැති කෘතිය සම්පාදනය කර ඇති අතරම විවිධ සඟරා මගින් ලිපි රාශියක්ම එළි දක්වා තිබේ. ඔහු *The New Lanka A Quarterly Review Vol . 11* ට ලියන ලද *Some Aspects of Rodiya and Kinnaraya Tribal Cultures* නමැති ලිපියෙහි, රොඩී සහ කින්නර ජනයා පිළිබඳව විස්තර දක්වා ඇත. තවද රාඝවාන්ගේ *The Term Rodiya and It 's Derivation ( Ethnological Survey of Ceylon ) Spoliazelanika* හි රොඩී ජනයා පිළිබඳව විස්තර දක්වා ඇත. එමෙන්ම ආර්.එල්. ස්පිටල් *The Story of Ceylon's Rodiyas , The Fortnightly Review* හි රොඩී ජනතාව පිළිබඳව අදහස් දක්වා ඇත. මේ ආදි වශයෙන් රොඩී ජනයාගේ ජීවන තත්ත්වයන් , සිරිත් විරිත්, සමාජ තත්ත්වය, ආදිය පිළිබඳව කරුණු ඉදිරිපත් කර තිබේ. එහෙත් රොඩී ජනතාවගේ වෙනස්වීම සම්බන්ධව කරුණු ඉහත ග්‍රන්ථවල සඳහන් වී නොමැත. මෙම අධ්‍යයනයේදී රොඩී ජනතාවගේ වර්තමාන වෙනස්වීම් කවරේ ද යන්න සාකච්ඡා කරනු ලැබේ. ඉහත සඳහන් අධ්‍යයනයන් තුළින් කරුණු රැසක් රොඩී ජනතාව සම්බන්ධයෙන් ඉදිරිපත් වුව ද ඔවුන්ගේ

සමාජ වෙනස්වීම පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් කර නොමැති බව පෙනී යයි.

රොඩී ජනතාව පිළිබඳ මා කළ සමාජ මානව විද්‍යාත්මක විශ්ලේෂණයේ ප්‍රථම පරිච්ඡේදයේදී රොඩී ජනතාව යනු කවුරුන් ද යන්න පිළිබඳව හැඳින්වීමට උත්සාහ ගත් අතර , පර්යේෂණයේ පරමාර්ථ, පර්යේෂණ නියැදිය සහ පර්යේෂණ ගැටලුව, පර්යේෂණ ක්‍රමවේදය සහ මූලාශ්‍ර පර්යේෂණ ක්‍රියාවලියේදී මතුවන ගැටළු හා සීමාවන් යන අංශ පිළිබඳව කරුණු සාකච්ඡා කළෙමි. මොවුන්ගේ ඓතිහාසික තත්ත්වය පිළිබඳව සලකා බැලීමේදී රොඩීන්ගේ ප්‍රභවය පිළිබඳ විවිධ ජන කථා දක්නට ලැබේ. පස්වැනි පරාක්‍රමබාහු රජුගේ දියණිය වූ නවරත්නවල්ලී කුමරියගෙන් මොවුන් පැවතෙන බව කියන කථා පුවතක් ද පවතියි. එමෙන්ම රොඩීන් පැරණි බ්‍රාහ්මණයින්ගෙන් ප්‍රභවය වූ බව ද කියැවේ. තවත් කථා පුවතකට අනුව රොඩීන් දඩයම් කරුවන්ගෙන් පැවතෙන බවයි.

දෙවැනි පරිච්ඡේදයේදී ඔවුන්ගේ ඓතිහාසික පසුබිම පිළිබඳව කරුණු අධ්‍යයනය කර ඇත. තවද භූගෝලීය වශයෙන් කුමන පළාත්වල ඔවුන් ජීවත් වූයේ ද යන්න සලකා බලා තිබේ. එමෙන්ම ඔවුන්ගේ සමාජ තත්ත්වයන් හා කාර්ය කොටස් සම්බන්ධව සමාජ විද්‍යාත්මක පසුබිමක සිට කරුණු විග්‍රහ කර තිබේ.

තුන්වැනි පරිච්ඡේදයේදී සමාජ වෙනස්වීම පිළිබඳ නිර්වචන කෙරෙහි අවධානය යොමු කර ඇත. ලොව සෑම සමාජයක්ම නිරන්තරයෙන්ම වෙනස්වීමට ලක්වෙමින් පවතී. ඕනෑම සමාජයකට වෙනස්වීම පොදු වූ ලක්ෂණයකි. සමාජ විද්‍යාඥයින් සමාජ වෙනස්වීම පිළිබඳව න්‍යායයන් ඉදිරිපත් කර ඇත. මේ අනුව සමාජ වෙනස්වීම පිළිබඳ න්‍යායයන් එනම් පරිනාමවාදී න්‍යාය , චක්‍රිය න්‍යාය , ක්‍රෘත්‍යවාදී න්‍යාය සහ ගැටුම්වාදී න්‍යාය සම්බන්ධව සමාජ මානව විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කළ මත සාකච්ඡාවට බඳුන් විය. ප්‍රාථමික සරල සමාජ හෝ වේවා ගැමි නාගරික සමාජ ආදී කුමන සමාජයක් වුව ද වෙනස්වීමට භාජනයවන විට ඒ කෙරෙහි බලපාන සාධක කවරේද යන්න පිළිබඳව සමාජ මානව විද්‍යාඥයින් අදහස් ඉදිරිපත් කර තිබේ. නාගරිකරණය , නවිකරණය